# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සඳහා වන අයදුම්පත් recruitment@pgim.cmb.ac.lk වෙත 2025 සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. කරුණාකර ඊමේල් පතෙහි විෂය තීරයේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

අදාළ අයදුම්පත් ආකෘතිය හා වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය වන https://pgim.cmb.ac.lk වෙතින් ලබාගත හැක. අදාළ නිර්දිෂ්ට අයදුම්පත් ආකෘති මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ අවශ්‍ය විස්තර සම්පූර්ණ නොමැති මෙන්ම සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීමට අවශ්‍ය සහතිකපත්‍රවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

## 01. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (තනතුරු 08)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී.
   - සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   - ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
   - ගණිතය

   යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතුය.

**සහ**

2. අපො.ස. (උ/ පෙළ) විභාගය, එක් වරකදී (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සියලුම විෂයයන්ගෙන් සමත් විය යුතුය. (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයන් තුනකින් සමත්වීම මේ සඳහා ප්‍රමාණවත් වේ.)
3. පහත සඳහන් සාමාර්ථයන් සහිත අයවලුන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

   අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයක (06) කාලයකට නොඅඩු පරිගණක යෙදවුම් සම්බන්ධව පිළිගත හැකි සුදුසුකම්.

   **සහ**

   ආ) පරිගණක යෙදවුම් භාවිතයෙහි වසර දෙකක පළපුරුද්ද.

**සටහන :** යෝග්‍යතාවය

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය** : රු. 49,475-17X540-58,655 (මාසික)

2025.01.01 දිනට [U MN 1(III)]

## 02. පුස්තකාල සේවක (II ශ්‍රේණිය) - තනතුරු 01

## 03. වැඩ සහකාර (III ශ්‍රේණිය) - තනතුරු 05

**සුදුසුකම්** : දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත්වී තිබීම

**වයස** : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**යෝග්‍යතාවය :**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරෙහි රාජකාරී මනාව ඉටුකිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය** : රු. 42,775 - 16X450- 49,975 (මාසික)

2025.01.01 දිනට [(U PL 1(III)]

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,**
**කොළඹ 07.**
**2025.08.28**